දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

සවිසා 3.2 - සංස්කෘතිය හා සංවර්ධනය
SGYG 3.2 - Culture and Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. i. සංස්කෘතිය පිළිබඳ නිර්වචන දෙකක් (02) සඳහන් කරන්න.
(ලකුණු 4)

ii. "සංස්කෘතික විසරණය" හා "විරෝධී සංස්කෘතිය" කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 6)

iii. "ශ්‍රී ලාංකේය සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ" විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

02. i. සංවර්ධනයේ අරමුණු හතරක් (04) දක්වන්න.
(ලකුණු 4)

ii. ඉන් දෙකක් (02) සංස්කෘතිකමය කරුණු සමග සම්බන්ධවන ආකාරය සැකෙවින් දක්වන්න.
(ලකුණු 6)

iii. "සංවර්ධනය සඳහා දායක කර ගත හැකි ශ්‍රී ලාංකේය සංස්කෘතික ලක්ෂණ" යන මැයෙන් රචනාවක් ලියන්න.
(ලකුණු 10)

03. i. නවීකරණ න්‍යායවාදීන් හතර (04) දෙනෙකුගේ නම් සඳහන් කරන්න.
(ලකුණු 4)

ii. "තාර්කිකකරණය" නම් සංකල්පයේ සංස්කෘතිකමය වැදගත්කම කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 6)

iii. සමාජ නවීකරණය තේරුම් ගැනීමේදී "රටා විචල්‍යයන්" ට හිමි තැන විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

04. i. සංස්කෘතිකමය ගැටුම් වර්ග හතරක් (04) සඳහන් කරන්න.
(ලකුණු 4)

ii. ඉන් දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.
(ලකුණු 6)

iii. සංස්කෘතිකමය ගැටුම් සමාජ වෙනස්වීම් කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

05. i. කුල ක්‍රමයේ ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න.

(ලකුණු 4)

ii. "ශ්‍රී ලංකා සමාජයේ කුලය තවමත් ජීවමානය" මෙම ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කළ හැකි කරුණු තුන (03) බැගින් දක්වන්න.

(ලකුණු 6)

iii. "කුල ක්‍රමය සංස්කෘතිකමය බන්ධනයක් ලෙස සංවර්ධනය අඩාල කරයි." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 10)

06. i. ගෝලීයකරණයේ ප්‍රතිජානාත්මක හා නිශේධනාත්මක ලක්ෂණ දෙක (02) බැගින් සඳහන් කරන්න.

(ලකුණු 4)

ii. ඉහත දක්වන ලද නිශේධනාත්මක ලක්ෂණ දෙක සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 6)

iii. "සංස්කෘතික ගෝලීයකරණය" යන මැයෙන් රචනාවක් ලියන්න.

(ලකුණු 10)

07. i. දකුණු ආසියාතික කාන්තාව වෙනස් කොට සැළකීමට භාජනය වන බවට පක්ෂව දැක්විය හැකි කරුණු හතරක් (04) සඳහන් කරන්න.

(ලකුණු 4)

ii. එම කරුණුවලින් දෙකක් (02) සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 6)

iii. කාන්තාව සංවර්ධනයට සක්‍රියව දායක කර ගැනීමට කළ හැකි යෝජනා මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

08. පහත දැක්වෙන මාතෘකාවලින් හතරක් (04) පිළිබඳ සටහන් ලියන්න.

i. නාගරිකරණය
ii. දිළිඳු බවේ සංස්කෘතිය
iii. බටහිරකරණය
iv. ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම
v. ආගමික අනන්‍යතාවය
vi. දේශපාලන ප්‍රචණ්ඩත්වය

(එක් පිළිතුරකට ලකුණු 5 බැගිනි)